**ශීර්ෂය 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය නොකළ මතය

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිළධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,
**(ආ)** ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතු වීම. | මුදල් රෙගුලාසි 110 විධිවිධාන ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |

### 1.6.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 104 (3),104 (4) | සමාලෝචිත වර්ෂයේ සිදු වී තිබු වාහන අනතුරු 04 ක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. එසේම පරීක්ෂණයෙන් පසු අලාභ හානි සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළතදී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළයුතු වුවද එසේ ද කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉදිරියේ දි වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(3) හා 104(4) අනුව කටයුතු කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී චක්‍රලේඛ මගින් ප්‍රාග්ධන වියදම්වලින් ඉතිරි කරන ලෙස දක්වා ඇති සියයට 25 ක ප්‍රමාණය සහ ආයතනය වෙත ඍජුව දන්වා ඉතිරි කරන ලෙස දක්වා ඇති ප්‍රමාණයන් හැරුණු විට තවදුරටත් මූලධන වැය විෂයයන් 2 කට හා පුනරාවර්තන වැය විෂයයන් 4 කට සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.9,750,000 කින් රු.3,607,216 ක | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව තාත්වික හා නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | 2019.06.17 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 04/2019 හි 02 ඡේදයට අනුව පුනරාවර්තන වියදම් අඩු කර ගැනීමට කටයුතු කල යුතු බව දන්වා ඇත.<br><br>2019.09.24 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 05/2019 ට අනුව ඉතිරි කර ඇත. |

| | | |
|---|---|---|
| ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. එය සියයට 26 සිට සියයට 100 දක්වා පරාසයක විය. | | **Westlaw data base** මඟින් නීති පොත් පරිශීලනය කල බැවින් පොත් මිලදී ගැනීමට අවශ්‍යතාවයක් ඇති නොවුණි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| රු.මිලියන 185 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයක් සහිතව නීති ප්‍රඥප්ති ඒකාබද්ධ කොට ප්‍රතිශෝධනය කිරීමේ ව්‍යාපෘතිය 2014 ජූලි 01 දින ආරම්භ කර 2017 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට නියමිතව තිබුණි. එහෙත් ව්‍යාපෘතිය නිම කර නොතිබූ අතර ව්‍යාපෘතිය නිම කිරීමට කාලය දීර්ඝ කිරීමක් 2020 දෙසැම්බර් දක්වා ලබා දී තිබුණි. 2014 වර්ෂයේ සිට 2019 වර්ෂය අවසානය දක්වා රු.මිලියන 11.687 ක් පමණක් වැය කර තිබූ අතර එම වියදම ඇස්තමේන්තු වටිනාකමින් සියයට 6 ක ප්‍රතිශතයක් විය. | නියමිත කාලය තුල ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කරා ලගා වීමට කටයුතු කළ යුතු වීම. | පනත් කෙටුම්පත්කරණයේ සුවිශේෂී නිපුණතාවයක් ඇති නිලධරයන් විසින්, සියුම්ව හා තාක්ෂණික ඇගැයීමකට ලක්කර, බුද්ධිය මෙහෙයවා, මෙම ව්‍යාපෘතියේ වැඩකටයුතු කළ යුතු වීමත් සහ එවැනි නිලධරයන් සිටිනුයේ අතළොස්සක් වීමත්, එකී කටයුතු කරන බහුතරයක් නිලධරයන් මෙම දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය රාජකාරි කරන නීති නිලධරයන් වීමත්, මෙම ව්‍යාපෘතිය සැලසුම් කිරීමේ දී අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා අධික කාලයක් වැය වන වැඩ ප්‍රමාණයක් ඉටු කිරීමට සිදුවීමත්, මෙම ව්‍යාපෘතිය සඳහා පත් කරන ලද සම්බන්ධීකරණ නිලධාරීන් අර්ධ කාලීන පදනම මත පත් කිරීමත්, විදෙස් ගත වීම හා සේවා කාලය අවසන් වීමත්, ව්‍යාපෘතියේ වැඩ කටයුතු සඳහා ලේකම්වරයකු පත් කරන ලෙස අනුමැතිය ඉල්ලා සිටියද ඒ වෙනුවට දෙපාර්තමේන්තුවේ නිලධරයකු ගෙවීමක් නොමැතිව පත්කර ගන්නා ලෙස දන්වා තිබීම නිසා එය ප්‍රායෝගික තීරණයක් නොවීමත් යනාදි වශයෙන් වූ ව්‍යාපෘතිය ඉටු කිරීමට ප්‍රමාද වූ සියලු කරුණු මා විසින් 2019.04.08 දිනැති ලිපියෙන් අධිකරණ අමාත්‍යංශයට දන්වා ඇත. ව්‍යාපෘතියේ වැඩ කටයුතු ඉදිරියට ගෙන යාම සම්බන්ධව උපදෙස් ඉල්ලා සිටි අතර ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සම්බන්ධව අධිකරණ අමාත්‍යංශ ලේකම් සමග 2020.03.05 දින පැවැත්වූ සාකච්ඡාවෙන් නව සම්බන්ධීකරණ නිලධාරීන් දෙදෙනෙකු පත්කිරීම සඳහා සොයා බැලීමට තීරණය කරන ලදී. |

## 3.2 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ප්‍රකාරව රාජ්‍ය අංශය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම මැයෙන් වූ චක්‍රලේඛය මඟින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවය තුළ කේන්ද්‍රගත වී පවත්නා මානව සම්පත රටේ සංවර්ධනය උදෙසා වඩාත් කාර්යක්ෂම හා සැලසුම් සහගතව යොදා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳ මඟපෙන්වීම් ලබා දී තිබුණද යථෝක්ත අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු ඉටු කර නොතිබුණි. | 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ප්‍රකාරව රාජ්‍ය අංශය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම මැයෙන් වූ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු සිදු කෙරෙමින් පවතී. අවසන් වූ වහාම එය ඉදිරිපත් කරමි. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 ජනවාරි 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය තුල නීති කෙටුම්පත් කිරීමේ කාර්යභාරය ඉටුකිරීම සඳහා සෘජුවම දායකත්වය ලබාදෙන ජ්‍යෙෂ්ඨ මට්ටමේ හා තෘතීයික මට්ටමේ තනතුරු 8 ක නිලධාරීන් 33 ක් එනම් ඊට අදාල අනුමත තනතුරු සංඛ්‍යාවෙන් සියයට 47 ක් පුරප්පාඩුව පැවතුණි. 2020 ජූලි මාසය වනවිට මින් අතිරේක නීති කෙටුම්පත් සම්පාදක සහ නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක තනතුරුවල පුරප්පාඩු වැඩ බැලීමේ පදනම මත සම්පූර්ණ කර තිබුණි. තවද ද්විතියික සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 5 ක 18 දෙනෙකුගේ ද පුරප්පාඩු විය. | අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වීම. | <u>අතිරේක නීති කෙටුම්පත් සම්පාදක, නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක</u><br>• සුදුසුකම් සම්පූර්ණ කරන ලද නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදකවරිය මෙම තනතුරෙහි පූර්ණකාලීනව වැඩ බැලීම සඳහා පත් කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දී ඇති අතර පුරප්පාඩුව කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2014 අනුව උසස් කිරීම මගින් පිරවීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් අනුමැතිය ඉල්ලා ඇත.<br><u>ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක</u><br>• සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරේ සේවා කාලය පදනම් කොටගෙන මෙම තනතුර ලබා දේ. දැනට උසස්වීම් ලබාදීමට ප්‍රමාණවත් සේවා කාලයක් (අවුරුදු 10) සම්පූර්ණ කර ඇති නිලධාරීන් දෙපාර්තමේන්තුව තුළ නොමැත.<br><u>සහකාර නීති කෙටුම්පත් සම්පාදක</u><br>• මෙම තනතුරු සඳහා අදාළ බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කර අනුමත කර ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවා ඇත.<br><u>භාෂා පරිවර්තක</u><br>• මෙම තනතුරු සඳහා අදාළ බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කළ යුතුව ඇති අතර එහි කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.<br>සහකාර අධ්‍යක්ෂ, පරිපාලන නිලධාරී, සංවර්ධන සහකාර, කළමනාකරණ සේවා නිලධාරී, ලේඛන සහකාර, සංස්කාරක හා රියදුරු පුරප්පාඩු පිරවීම සඳහා අදාල ආයතන හා අමාත්‍යාංශ වෙත දන්වා ඇත. |